# මහින්දාගමනය හා බැඳි සංස්කෘතික පුනර්ජීවය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

*එම්.ඒ ප්‍රසාද් කුමාර*

## ප්‍රවේශය

ක්‍රි.පූ 06 දී පමණ සම්බුද්ධ පරිනිර්වාණය සිදු වූ වෙසක්පුර පසළොස්වක දිනයේදී ම විජය ඇතුළු පිරිස පැමිණ මෙරට ආර්යය ජනාවාසයක් බවට පත්කරන ලදි. ඉන් අනතුරුව තෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයක් ලෙස මිහිඳු මහරහතන් වහන්සේ ශ්‍රී ලංකාවට වැඩම කිරීමෙන් පසු මෙරට බෞද්ධ රටක් බවට පත් විය. එය සිංහල සංස්කෘතිය ශිෂ්ටාචාරයකට, ලොව ශ්‍රේෂ්ඨතම සභ්‍යත්වයකට පරිවර්තනය වීමේ සහ සංවර්ධනය වෙමින් ඉදිරියට විකාශනය වීමේ ප්‍රමුඛතම අවස්ථාවයි. කිසියම් ජනතාවකගේ පුද්ගල ජීවිතයත්, සමාජ ජීවිතයක් එකට සම්බන්ධ කොට එය විධිමත් කරන ආකල්ප හා චර්යා සමූහය ඒ ඒ ජනතාවගේ සංස්කෘතිය ලෙස අර්ථ නිරූපණය කළ හැකිය. ආහාරපාන පරිහරණ විධි, ඇඳුම් පැළඳුම්, කතාබහ, ඇදහිලි, සමාජ සබඳතා, භාෂාව, කලාශිල්ප, ආගම දහම, ජනප්‍රවාද, ජනශ්‍රැති හා සෞන්දර්යය ආශ්වාද ක්‍රම සියල්ලම එක් රැස් වීමෙන් සංස්කෘතිය නිර්මාණය වේ. මහින්දාගමනයේ ප්‍රතිඵලයක් ලෙස රාජ්‍යාභිෂේකය ලක්දිව ස්ථාපිත වූ අතර රාජ්‍ය සංස්ථාව හා ආගමික සංස්ථාව එකට බැඳෙමින් සංස්කෘතික පුනර්ජීවයකට මග සැසී තිබේ. මහින්දාගමනය හා බැඳි සංස්කෘතික පුනර්ජීවය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යනයක් මෙම ලිපියෙන් සිදු කෙරේ.

මෙම අධ්‍යයනය සඳහා තොරතුරු රැස් කිරීමේදී මූලික වශයෙන් පුස්තකාල පරිශීලනය සිදු කරන ලද අතර ඒ යටතේ පුස්තුතයට අදාළ ව මෙතෙක් පළවී ඇති ප්‍රාථමික හා ද්විතියක මූලාශ්‍රය අධ්‍යයනයට ලක් කෙරිණි. මිහින්තලා පරිශ්‍රය තුළ වර්තමාන තත්ත්වය හා පැරණි අභිලේඛන ද අධ්‍යයනය කරමින් ප්‍රස්තුතය විචාරාත්මක ප්‍රවේශයකින් සාකච්ඡාවට බඳුන් කිරීම මෙහි ක්‍රමවේදය වෙයි.

## විමර්ශනය

### දෙවනපෑතිස් රාජ්‍යය සමය හා මහින්දාගමනය

මෞර්ය අධිරාජ්‍යයා සමග පැවැත් වූ සබඳතාවයේ ප්‍රතිඵලයක් වශයෙන් මෙරට ආගමික හා සංස්කෘතික ක්ෂේත්‍රයේ විශාල වර්ධනයක් ඇති වී තිබේ. අශෝකගේ අභිෂේකයෙන් අටවන අවුරුද්දේ සිදුවූ කාලිංග යුද්ධය හේතුකොටගෙන එක්ලක්ෂ පනස්දහසක පමණ පිරිසක් ජීවිතක්ෂයට පත්වීමත්, ඊට සමාන පිරිසක් අන්ධයන් සහ කොරුන් බවට පත්වීමත්, ඊට සමාන පිරිසත් සිරකරුවන් බවට පත් වූ බවත් ඔහුගේ 13 වන ගිරි ලිපියේ සඳහන් වේ. එයින් කම්පාවට පත් වූ අශෝක රජු දිග්විජය ප්‍රතිපත්තිය අතහැර ධර්ම විජය ප්‍රතිපත්තියට ප්‍රවිෂ්ට වීමෙන් සිදුකළ තුන්වන ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයක් වශයෙන් ලක්දිවට බුදුදහම එවන ලදී. එනම් අශෝකගේ අභිෂේකයෙන් 18 වන අවුරුද්දේ දී මොග්ගලිපුත්තතිස්ස මහරහතන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් හා භික්ෂූන් දහසකගේ සහභාගිත්වයෙන් පාඨලිපුත්‍රයේ අශෝකාරාමයේ පැවැත් වූ තුන්වන ධර්ම සංගායනාවෙන් අනතුරුව ලක්දිව ඇතුලු රටවල් 09 කට බුදුදහම යැවීමට තීරණය කෙරිණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් ලංකාවට බුදුදහම හඳුන්වාදුන් බව පැහැදිලි ය.

ලක්දිවට බුදුදහම හඳුන්වා දීම ඉතා සංවිධානාත්මක ක්‍රියාදාමයන් රාශියක ප්‍රතිඵලයක් වශයෙන් සිදුවූ බව පැහැදිලි වන්නේ ධර්ම සංගායනාව අවසන් වී දෙසතියක් ගතවීමට පූර්වයෙන් ලංකාව හැරුණුවිට අනෙත් රටවලට ධර්මදූත පිරිස පිටත් කර හරිනු ලැබුව ද ලක්දිවට ධර්මදූත පිරිස් එවීමට කාලයක් ගත වූ බැවිනි. ඊට හේතුවූයේ එවකට ලාංකීය පාලකයා වූ මුටසිව රජු මහලුවියේ පසුවීම නිසා මහලුවියේ පාලකයකු කල අලුතින් ආගමක් දර්ශනයක් ව්‍යාප්තවීමේ ඉඩකඩ ඉතා අඩු නිසා තරුණ පාලකයකු බලයට පත් වන තුරු ධර්මදූත කණ්ඩායමට බලා සිටීමට සිදුවීමයි. සංගායනාව අවසන් වී මසකින් පමණ පසු මුටසීව රජු මියගිය බවත්, ඔහුගෙන් පසුව දේවානම්පියතිස්ස රාජ්‍යත්වයට පත් වූ බවත් සඳහන් වේ. ඔහු රාජ්‍යත්වයට පත් වී සත්දිනකින් අරිට්ඨ ප්‍රමුඛ දූත පිරිසක් ඉන්දියාවට පිටත් කර යවනු ලැබීය. ඔවුන් මාස 5 ක පමණ කාලයක් ඉන්දියාවේ නැවතී සිටි බව සඳහන් වී තිබීමෙන් මේ වනවිට ලක්දිවට පැමිණීමේ අපේක්ෂාවෙන් සිටි මිහිඳු මාහිමි ප්‍රමුඛ ධර්මදූත පිරිස මුණගැසෙන්නට ඇති බවත්, ඔවුන් මගින් ලාංකීය ජනතාවගේ භාෂාව, ක්‍රියාකලාප, සිතුම් පැතුම්, ප්‍රාග් බෞද්ධ ඇදහිලි පිළිබඳ ව විමසා බලා පැහැදිලි අවබෝධයකින් යුක්තව ලක්දිවට පැමිණි බව පැහැදිලි ය. ඒ අනුව මහාවංසය ඇතුලු වංසකතාගත තොරතුරු කියවන විට අහඹු ලෙස ලක්දිවට බුදුදහම හඳුන්වා දුන් බව විස්තර කර තිබුණ ද එම විස්තර සියුම්ව අධ්‍යයනය කිරීමේ දී ලක්දිවට බුදුදහම හඳුන්වා දීම ඉතාම සංවිධානාත්මක ක්‍රියාකලාපයක ප්‍රතිඵලයක් වශයෙන් සිදු වූ බව පැහැදිලි ය.

දේවානම් පියතිස්ස රජුකල මිහිඳු හිමියන් ප්‍රමුඛ ඉට්ඨිය, උත්තිය, සම්බල, භද්දසාල, සුමන සාමණේර සහ භණ්ඩුක උපාසක යන අයගේ පැමිණීමේ ප්‍රතිඵලයක් ලෙස ලංකාවේ භික්ෂු සහ උපාසක පිරිසකගේ ආරම්භයක් ඇතිවිය. අනුලා බිසව භික්ෂුණී ශාසනය පිහිටවනු ලෙස මිහිඳු හිමිගෙන් කරන ලද ඉල්ලීමේ ප්‍රතිඵලයක් ලෙස අරිට්ඨ ඇමතියන් නැවත ඉන්දියාට පිටත් කර සංඝමිත්තා මෙහෙණිය ඇතුලු පිරිස ලක්දිවට වැඩම කරවීමෙන් භික්ෂුණී සහ උපාසිකා යන පිරිසකගේ ආරම්භයක් ඇති වූ බව පැහැදිලි ය. ඒ අනුව දේවානම්පියතිස්ස රජු කල භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යන සිව්වනක් පිරිසකගේ ආරම්භයක් ඇති වු බව පැහැදිලි ය.

දේවානම්පියතිස්ස රජුකල ලක්දිවට හඳුන්වාදුන් බුදුදහම ස්ථිර වශයෙන් මෙරට තුළ ස්ථාපිත වීම සිදුවූයේ ප්‍රථම වරට දේශීය පුද්ගලයින් අතරින් අරිට්ඨ ඇමති සහ අනුලා බිසව භික්ෂු භික්ෂුණී ශාසනයට ඇතුලු වී විනය කර්ම ප්‍රගුණ කිරීමත් සමඟ ය. එමෙන්ම මෙකල ලක්දිවට හඳුන්වාදුන් බුදුදහම මෙරට පැවැති ප්‍රාග් බෞද්ධ ඇදහිම් යටපත් කොට ස්ථාපිත වීම කෙරෙහි හේතු කිහිපයක් බලපා තිබේ. එනම් අශෝක අධිරාජ්‍යයාගේ මැදිහත්වීම මත බුදුදහම හඳුන්වාදීමත්, ලාංකීය පාලකයා වූ දේවානම්පියතිස්ස රජු බුදුදහම වැළඳගෙන එය රාජ්‍ය ආගම බවට පත්කර ඊට පූර්ණ රාජ්‍ය අනුග්‍රහය ලබාදීමත්, ලංකාවේ පැවති ප්‍රාග් බෞද්ධ ඇදහිලි අතර ස්ථිර ආගමක් දර්ශනයක් සහිත ප්‍රබල ආගමක් නොමැතිවීමත්, බුදුදහම ඉතා සංවිධානාත්මක වීමත්, මිහිඳු හිමි ඉතා සංවිධානාත්මක ආකාරයෙන් ලක්දිවට බුදුදහම හඳුන්වා දීමත් බලපා තිබේ.

දේවානම්පියතිස්ස රජු කල ලක්දිවට හඳුන්වා දුන් බුදුදහම එම කාලපරිච්ඡේදය තුළ ම ලක්දිව පුරා ව්‍යාප්ත විය. එනම් මෙකල ශ්‍රී මහා බෝධි රෝපණ උත්සවයේ දී බෝධි අංකුර ගෙනයාම සඳහා කතරගම, සඳුන්ගම, මාගම සහ කැලණිය ආදි ඈත ප්‍රදේශවලින් ප්‍රාදේශිය කුමාරවරුන් අනුරාධපුරයට පැමිණිබව සඳහන් වී තිබීමෙන් පැහැදිලි වේ. එමෙන්ම තිස්සමහාරාම හා කිරින්ද ප්‍රදේශයෙන් හමු වූ ඉපැරණි ශිලාලිපි දෙකක නාග නම් උපරාජ කෙනෙකු මිත්‍යාදෘෂ්ටිය අතහැර බුදුදහම වැළඳගත් බව සඳහන් වී තිබීමෙන් අනුරාධපුරයට හඳුන්වාදුන් බුදුදහම ලංකාවේ ඈත ප්‍රදේශ දක්වා ව්‍යාප්තව පැවති බව පැහැදිලි වේ.

දේවානම්පියතිස්ස රජු කල සිදු වූ මහින්දාගමනය පුරාවිද්‍යාත්මකව ද සනාථ වී තිබේ. එනම් ක්‍රි.ව. පළවන ශතවර්ෂයට අයත් මිහින්තලයේ මහාදාඨික මහානාග රජුගේ ශිලා ලිපියක මහින්ද, භද්දසාල, ඉට්ඨිය, උත්තිය යන අයගේ නම් සඳහන් වී තිබීමෙන් සනාථ වේ. එමෙන්ම සාංචි ස්ථූපයේ අංක 2 දරණ ස්ථූපයෙන් හමු වූ ධාතු කරඬු කිහිපයක තුන්වන ධර්ම සංගායනාවේ මූලිකත්වය ගෙන කටයුතු කළ මොග්ගලිපුත්ත තිස්ස හිමිගේ සහ හිමාල ප්‍රදේශයට ධර්මය ප්‍රචාරය කළ මජ්ඣිම සහ කස්සපගොත්ත යන අයගේ නම් සඳහන් වී තිබීමෙන් තහවුරු වේ. අම්පාර දිස්ත්‍රික්කයේ රජගල ශිලා ලේඛනයෙහි මහින්ද සහ ඉට්ඨිය යන අයගේ නම් සඳහන් වී තිබීමෙන් එය වඩාත් තහවුරු වී ඇත.

එමෙන්ම සාංචි ස්තූපයේ නැගෙනහිර දොරටු නාමපුවරු දෙකක ශ්‍රී මහා බෝධිය ලක්දිවට වැඩම කරවීම කැටයම් කර තිබීමෙන් ද, අශෝකගේ 13 වන පර්වත ලිපියෙහි තම්බපන්ණියා නම් ප්‍රදේශයට ධර්ම දූතයන් යැවූ බව සඳහන් වී තිබීමෙන් ද දේවානම්පියතිස්ස රජු කල සිදු වූ මහින්දාගමනය සම්බන්ධ තොරතුරු පුරාවිද්‍යාත්මකව සනාථ වී ඇති බව පැහැදිලි ය.

## මහින්දාගමනය හා සංස්කෘතික පුනරුදය

ලොව අසම සම බෞද්ධ ශිෂ්ටාචාරයක විස්මිත නිමැවුම් ලොවට දායාද කළ ඓතිහාසික ගමනක ප්‍රභවය හා විකාශනය සටහන් කරන්නේ මහින්දාගමනය මගිනි. වාස්තුවිද්‍යාව, සාහිත්‍ය, හා භාෂාශාස්ත්‍ර, ලේඛන කලාව, වාරිතාක්ෂණ හා ජල ශිෂ්ටාචාරය, මූර්ති, ප්‍රතිමා, කැටයම්, වතාවත්, පුදසිරිත්, චර්යාවන්, දැහැමි ජීවනෝපාය වැනි වාස්තවික ප්‍රපංචයන් රැසකින් සමන්විත වූ බෞද්ධ සංස්කෘතිය සහ ඒ මත නිර්මාණය වූ බෞද්ධ ශිෂ්ටාචාරය අපට දායාද වූයේ මේ නිසා ය. මහින්දාගමනය තුළින් සුපෝෂිත සංස්කෘතිය පිළිබඳ මෙතැන් සිට විමසා බැලේ.

## ශ්‍රී ලාංකේය වැසියාට ස්ථිර ආගමක් ලෙස බුදු දහම හිමිවීම

ලක්දිවට බුදුදහම හඳුන්වා දෙනු ලැබුවේ දේවානම්පියතිස්ස කල සිදුවූ මහින්දාමනයෙන් අනතුරුව බව තහවුරු වී ඇතත් දෙවනපෑතිස් රජු කල සිදු වූ මහින්දාගමනයට පෙර ලක්දිව ජනතාව බුදුන් වහන්සේ පිළිබඳවත්, බුදුදහම පිළිබඳවත් දැන සිටින්නට ඇතැයි සිතීමට සාධක හමු වී තිබේ. එනම් මහාවංශ විස්තරයට අනුව, බුදුන් වහන්සේ තෙවතාවක් ලක්දිවට වැඩම කළ බව, බුදුන් වහන්සේට සමකාලීනව තපස්සු භල්ලුක වෙළඳ දෙබෑයන් බුදුන් වහන්සේගේ කේශධාතු මිටක් ලක්දිවට ගෙනැවිත් ගිරිහඬු සෑයෙහි තැන්පත් කිරීම[1], පූජනීය වස්තු ලබා කළ මහියංගන, නාගදීපය, මැණික් පුටුව, ශ්‍රීපාදය, සමනොලගිර වැනි ස්ථාන රටතුළ පිහිටා තිබූ නිසා බුදුදහම පිළිබඳ දැනුම් තේරුම් ඇති පිරිසක් රට තුළ වාසය කළ බවට කිසිදු සැකයක් නැත.

කෙසේ වෙතත් ප්‍රාග් බෞද්ධ යුගයේ මිනිසා භයින් තැතිගෙන සිදුකළ යක්ෂ යක්ෂණී වන්දනය, පර්වත, රුක්ඛ වන්දනය, හිරු, සඳු දේව ඇදහිලි, බලිබිලි පූජාවන් සියල්ලටම නිමවා දෙමින් එක් ප්‍රබල ආගමක් ලෙස බුදුදහම ජනතාව අතරට පැමිණියේ මහින්දාගමනය සමගිනි. මිහිඳු හිමියන්ගේ ආගමනය තුළින් සිදුවූයේ එක් පූජාවන්ට නව අර්ථකථනයන් ඉදිරිපත් කොට ඒ අනුසාරයෙන් ඒවා පවත්වාගෙන යාමට ඔවුන්ට උපදෙස් ලබාදීම ය. ගස්, ගල්, වන පර්වත දේව විශ්වාසයන් පදනම් කොට ගෙන වැඳුම් පිදුම් සරණ ගිය අයට සම්බුද්ධ ධාතු නිධන් කොට තැනූ චෛත්‍ය වන්දනාව, පාරිභෝගික බෝධීන් වහන්සේ වන්දනය වැනි අර්ථාන්විත ක්‍රමවේදයන් සම්පප කොට තිබේ. මෙසේ මිහිඳු මහරහතන් වහන්සේ විසින් ලක්දිවට ගෙන ආ නිර්මල බුදු දහමත්, බුදු දහමින් ප්‍රභාවත් කරගන්නා ලද අශෝක රාජ්‍ය පාලන ධර්ම හා බෞද්ධ සමාජ ධර්මත්, දෙවනපෑතිස් රජුගේ ප්‍රධානත්වයෙන් රට පුරා ප්‍රචාරය කර හරින ලදින් ලාංකේය ජන සමාජයේ අතිවිශාල පරිවර්තනයක් සිදු වී ඇත. මනා සංවිධානාත්මක ලෙස ජනතාව අතර බුදු දහම පැතිර යාම නිසා මළවුන් වන්දනය, වෘක්ෂ වන්දනය, යක්ෂ වන්දනය වැනි ප්‍රාථමික ඇදහිලි හා විශ්වාස වලින් මිදී තෙරුවන් සරණ යාම, පංචශීල ප්‍රතිපත්ති ආරක්ෂා කිරිම ආදිය මගින් මනා වූ ශික්ෂයක් හිමි කරගෙන ඇත. ආර්යඅෂ්ඨාංගික මාර්ගය අනුව සිටින්නට තම ජීවිතයේ සවිමත් පදනම කරගත් මෙරට ජනතාව හික්මීමෙන් යුතුව අවිහිංසාවදය, අල්පේච්ඡ ජීවිතය ආදියට හුරුපුරුදු වූයේ මහින්දාගමනය නිසා උදා වූ නව සංස්කෘතියේ ආරම්භය සමඟ ය.

## මහින්දාගමනය හා අධ්‍යාපනය

ශ්‍රී ලංකාවට විධිමත් ලෙස අධ්‍යාපනය ආරම්භ වීම කවදා සිදුවූවක් දැයි නිශ්චිත ලෙස ම ප්‍රකාශ කළ නොහැකි ය. එහෙත් ක්‍රි.ව. 03 වන සියවසේ මහින්දාගමනයෙන් පසුව එය ආරම්භ වන්නට ඇතැයි බොහෝ විද්වතුන් නොයෙක් අදහස් දක්වා තිබේ. ඇතැම් පාලි වංසකතාවන්හි ඇතුළත් තොරතුරු සළකා බලා කළ මෙබඳු විවරණයන්හි පැරණි බ්‍රාහ්මී ලිපිවල ඇතුළත් අධ්‍යාපනය පිළිබඳ තොරතුරු

1 සෙනරත් පරනවිතාන, **පුරාවිද්‍යා පර්යේෂණ**, (බොරලැස්ගමුවඃ මධ්‍යම සංස්කෘතික අරමුදල,1972),207 පිට.

කෙරෙහි කිසිදු අවධානයක් යොමු කොට නැති බවක් ද පෙනෙන්නට තිබේ. විශේෂයෙන් මහින්දාගමනය සිදු වන විටත් ශ්‍රී ලාංකේය වැසියා බුද්ධියේ හා ශක්තියේ ඉහළ මට්ටමක සිටි බවට තොරතුරු ලැබී ඇත. මහින්ද හිමි හා දෙවනපෑතිස් අතර ඇති වූ සංවාදය ප්‍රථම බුද්ධි පරීක්ෂාවයි. පණ්ඩුකාභය කුමරුට ශිල්පශාස්ත්‍ර ඉගැන්වූ පණ්ඩුල නම් බ්‍රාහ්මණයා පිළිබඳව පූර්ව බ්‍රාහ්මීය ශිලා ලේඛනයක තොරතුරු ඇතුළත් වී ඇත.[2] දෙවනපෑතිස් රජුට අධ්‍යාපනය ලබා දෙන ලද ගොබුත් නම් බ්‍රාහ්මයකු ගැන ද අසන්නට ලැබේ.

"**මහරඣස දෙවන පියහ අචරිය බමණ ගොබුතිය ලෙණෙ**" මහරජ දෙවන පෑතිස් රජුගේ ආචරිය බ්‍රාහ්මණ ගොබුතිගේ ලෙනයි"[3] යනුවෙන් සඳහන් වන නිසා මිහිඳු හිමියන් ලක්දිවට පැමිණෙන විටත් ලක්දිව දියුණු අධ්‍යාපන ක්‍රමයක් තිබුණු බවට ඉඟි ලැබේ. එහෙත් මහින්දාගමනයෙහි ප්‍රතිඵලයක් ලෙස මෙලෙස බමුණන් අත පැවති අධ්‍යාපනය භික්ෂූන් අතට පත්වීමත් සමඟ ජාතික සංස්කෘතික ප්‍රගමනයේ ඉදිරි ගමනට ප්‍රවේශය සැළසී තිබේ.

පැරණි සමාජයිය පැවැත්ම හා ශ්‍රේෂ්ඨ පුද්ගලයකු වීමට අවශ්‍ය කරන සංකල්ප ප්‍රායෝගිකව ක්‍රියාත්මක වූ ආරාම මූලික කරගත් අධ්‍යාපන ක්‍රමය බුදු දහම මානව ශිෂ්ටාචාරයකට උරුම කර දෙන දායාදය ලෙස ද සැලකිය හැකි ය. මෙම අධ්‍යාපන ක්‍රමවේදය ඉන්දියාවේ විවිධ ආරාමවල ව්‍යාප්ත වී දියුණු වූ අතර මිහිඳු හිමියන්ගේ ආගමනයත් සමග එකී ආරාමික අධ්‍යාපනය ලක්දිව ස්ථාපිත වී තිබේ. අනුරාධපුර යුගයේ තිබූ මහාවිහාර, අභයගිරි, ජේතවන පිරිවෙන වැනි භික්ෂු වාසස්ථාන අධ්‍යාපන මධ්‍යස්ථාන ලෙස දියුණුවට පත් වී ඇත්තේ මහිනාදගමනයේ ප්‍රතිඵල ලෙසිනි. මෙසේ නිර්මාණය වූ අධ්‍යාපනයේ ස්වර්ණමය අවධිය කෝට්ටේ රාජ්‍ය සමයේ සනිටුහන් වූ අතර තොටගමුවේ විජයබා පිරිවෙන, පැපිලියානේ සුනේත්‍රාදේවි පිරිවෙන, දෙවිනුවර තිලකසිරි පිරිවෙන කැරගල පද්මාවති පිරිවෙන, වීදාගම සිරි සනානන්ද පිරිවෙන ආදී පිරිවෙන් දක්වා විකාශනය වී තිබේ. මෙසේ අනුරාධපුර යුගයේ සිට අඛණ්ඩව විකාශනය වූ පිරිවෙන් අධ්‍යාපන ක්‍රමය මහින්දාගමනය නිසා ලක්දිවට හිමි වූ සංස්කෘතික දායාදයක් ලෙස හඳුනාගත හැකි ය.

**බ්‍රාහ්මීය අක්ෂර කලාව හා සාහිත්‍ය උන්නතිය**

ශ්‍රී ලංකාවේ ව්‍යවහාර වූ දැනට කියවා තේරුම්ගෙන ඇති පැරණිම අක්ෂර ක්‍රමය බ්‍රාහ්මීය අක්ෂර ක්‍රමය නමින් හැඳින්වේ. මිහිඳු හිමියන් හඳුන්වා දුන් බ්‍රාහ්මීය අක්ෂර මාලාව ක්‍රමානුකූලව වැඩෙමින් අනුරාධපුර යුගයේ අගභාගය වන විට ව්‍යක්ත අදහස් ප්‍රකාශ කළ හැකි අක්ෂර මාලාවක් බවට සංවර්ධනය විය. ආර්යයන් ක්‍රි.පූ. 1500 දී ඉන්දියාවට පැමිණෙන විට ඔවුන් අතර ලේඛන කලාවක් නොතිබූ බව පිළිගත් අදහසකි.[4] ආර්යයන්ගේ මුල්ම ලේඛන වනුයේ මෞර්යය අශෝකයන්ගේ ධර්ම ප්‍රචාරක කටයුතු සඳහා භාවිතා කළ ධර්ම ප්‍රචාරක ශිලා ලේඛනයන් ය. ක්‍රි.පූ 03 වැනි සියවසට පෙර යුගයෙහි ලේඛන කලාවක් ඉන්දියාවේ නොවූ බව මැක්ස්මුලර් පෙන්වා දී තිබේ.[5] අශෝක අධිරාජ්‍යයා සමස්ත භාරතය පුරා ධර්ම ප්‍රචාරක කටයුතු සඳහා අභිලේඛන පිහිටුවීය. ඒ සඳහා යොදාගෙන ඇත්තේ මෙකී බ්‍රාහ්මීය අක්ෂරය. එක් අක්ෂර මාලාව දෙරට අතර සබඳතාව නිසා මහින්දාගමනයේ ප්‍රතිඵලයක් ලෙස ලංකාවට ලැබුණු බව සාමාන්‍ය පිළිගැනීමයි. එහෙත් අනුරාධපුරයේ ඇතුළු නගරය ආශ්‍රිත කැණීම්වලින් ක්‍රි.පූ 600 - 500 අතර කාලසීමාවේ මෙම දිවයිනෙහි බ්‍රාහ්මීය අක්ෂර භාවිතා කළ බවට නිශ්චිත සාක්ෂි ලැබී ඇත. එනිසා පෙර කියන ලද සාම්ප්‍රදායික මතය නූතනයේ විවේචනයට ලක් වී ඇති ස්වභාවයක් හඳුනාගත හැකි ය. තත්ත්වය මෙසේ වුව ද සඟමිත් තෙරණිය සමඟ පැමිණි අටළොස් කුලයක ශිල්පීන් අතර බ්‍රාහ්මීය අක්ෂර පිළිබඳව ප්‍රවීණත්වය ලත් ශිල්ප ශ්‍රේණීන් සිටි බවට මූලාශ්‍රය තොරතුරු අනාවරණය කරන නිසා මහින්දාගමනයත් සමඟ බ්‍රාහ්මීය අක්ෂර කලාවේ පැහැදිලි ප්‍රගමනයක් සිදු වූ බව පැහැදිලි වේ.

මිහිඳු හිමියන් හඳුන්වා දුන් බ්‍රාහ්මීය අක්ෂර මාලාව ක්‍රමානුකූලව වැඩෙමින් අනුරාධපුරය අගභාගය වන විට ව්‍යක්ත අදහස් ප්‍රකාශ කළ හැකි අක්ෂර මාලාවක් බවට සංවර්ධනය වූ බව පෙර සඳහන් කෙරිණි. පාලි ත්‍රිපිටකය හෙළ අටුවා බවට පත් කිරීමට අක්ෂර මාලාවේ සංවර්ධනය ඉවහල් වී තිබේ.

2 මහාවංශය, X : 20-21 පිටු

3 **Inscriptions of Ceylon,** vol 1, 469., 35p.

4 පෝල්, එම්, ජයරාජන්,**සිංහල ආකාරදියේ පරිණාමය පිළිබඳ ඉතිහාසය**, කතෘ ප්‍රකාශනය,4 පිට.

5 වින්ටර්නිට්ස්, **ඉන්දීය සාහිත්‍ය ඉතිහාසය**, 22-23 පිටු.

ක්‍රි.පූ 05 වන සියවසේ දී මෙරටට පැමිණි බුද්ධඝෝෂ හිමියන් හෙළටුවා සිංහලට පරිවර්තනය කළ බවද අසන්නට ලැබේ. මෙසේ අක්ෂර මාලාවේ සිදු වූ සීඝ්‍ර වර්ධනය පසුකාලීන ලේඛන කලාවේ හා සාහිත්‍ය උන්නතියට පවා ඉවහල් වී තිබේ. ඉපැරණි ගද්‍ය පද්‍ය සාහිත්‍යයට බුදුදහම නිරන්තරයෙන් බලපා ඇත. ආගමික චින්තනය ජනතා සිත් සතන්හි පිහිටවන වස් මෙකී ගද්‍ය පද්‍ය සාහිත්‍ය ප්‍රබල අවියක් වූ බව ද පෙනේ.

"පෙදෙන් බුදු සිරිතැ - බසින් වත් සිරිත් ඇ

පද යුතු බසින් නළු ඇ - අනතුරු ලකුණු දක්වමි"

පද්‍යයෙන් බුද්ධ චරිතයත්, ගද්‍යයෙන් ධර්ම ශාස්ත්‍රාදියත්, ඒ දෙකෙහි සම්මිශ්‍රිත ව නාට්‍යාදියත් රචනා කළ යුතු බව සියබස්ලකර කතුවරයා සිය කෘතියේ දක්වා ඇත. අනුරාධපුර යුගයේ දී බුදු සිරිත අළලා රචනා කළ පද්‍යපාඨ හමු නොවුවත් පොළොන්නරු යුගයේදී බුදු සිරිතට අදාළව ලියැවුණු පද්‍ය ග්‍රන්ථ ලෙස මුවදෙව්දාවත, සසදාවත වැදගත් වේ. කව්සිළුමිණ, ගුත්තිලය, කාව්‍යශේඛරය, බුදුගුණ අලංකාරය, පරවි සන්දේශය, සැළලිහිණි සන්දේශය, ලෝවැඩ සඟරාව වැනි සිංහල ගද්‍ය පද්‍ය රැසක් පසුකලෙක නිර්මාණය වන්නේ මහින්දාගමනයෙන් ලැබ් සංස්කෘතියේ ප්‍රතිඵල ලෙසිනි.

**සිතුවම් කලාව**

මහින්දාගමනයෙන් හිමි වූ සංස්කෘතිකාංග අතර සිතුවම් කලාව ද නතුවෙයි. විහාර, ආරාම, ලෙන්ගුහා ආදියේ ද මනහර බිතුසිතුවම් චිත්‍රණය කිරීමට පැරණි කලාකරුවෝ සමත් වූහ. මිහිඳු හිමියන් ලක්වැසියාට බුදු දහම හඳුන්වාදීමෙන් අනතුරුව බුදු සිරිත හා ජාතික කතා ඉගැන්වමේ මාධ්‍යයක් ලෙස මෙම චිත්‍ර කලාව යොදාගෙන තිබේ. මහින්දාගමනයට පෙර මෙරට චිත්‍ර කලාවක් පැවතියේ නම් එය මනා කොට සංවර්ධනය වූයේ බුදු දහමෙන් ලත් මනා ශික්ෂණයෙන් ය. දෙවනපෑතිස් කුමරු රාජ්‍යත්වයට පත් වූ සමයෙහි සිටම ලාංකේය කලාකරුවන් ශිල්ප ශාස්ත්‍රය සම්බන්ධයෙන් උසස් තත්ත්වයක් ලබා සිටි බැව් සඳහන් කළ හැකි ය.

මහින්දාගමනයෙන් පසු දියුණු වූ බෞද්ධ චිත්‍ර මාලාව ගැන ප්‍රථම වරට තොරතුරු සඳහන් මහාවංසයෙහි ය. දුටුගැමුණු රජු (ක්‍රි.ව 161 - 137) විසින් මහා ථූපය ඉදිකරන අවස්ථාව විස්තර කිරීමේදී එහි ධාතු ගර්භයේ අභ්‍යන්තර බිත්ති මත චිත්‍ර ඇඳ තිබූ බවට තොරතුරු දක්වා තිබේ.[6] "සත් සතියේදී ඇති වූ සිද්ධීන් කිහිපයක් ධාතු ගර්භයේ තැනින් තැන චිත්‍රගත කරන්නට රජු අණ කළේය. බුදුන් වහන්සේගේ බුද්ධත්වයේ සිට පරිනිර්වාණය දක්වා ජීවිත කතාවේ අවස්ථා මේ අතර විය. බුද්ධ භක්තිය තර කිරීමට සුදුසු ජාතික කතා ද රජු විසින් එහි චිත්‍ර ගත කරවන ලදී. වෙස්සන්තර ජාතකය සම්පූර්ණයෙන්ම පෙන්වන ලෙසටත් නිර්දේශ කරන ලදී"

මේ අනුව පෙනීයන්නේ දුටුගැමුණු රාජසමයේ බෞද්ධ චිත්‍ර කලාව ප්‍රධාන ස්ථානයක තිබුණු බව ය. තම වැඩිමහලු සොයුරාගේ අවසාන මොහොතේ දී මහාථූපය ගොඩනඟා අවසාන බව පෙන්වීම පිණිස සද්ධාතිස්ස කුමරු විසින් කර්මාන්තකරුවන් හා චිත්‍ර ශිල්පීන් යෙද වූ බව මහාවංසය කියයි.[7] බෞද්ධ චිත්‍ර කලාව මුළුමනින්ම යොදාගනු ලැබුවේ බෞද්ධ පරිසරය පුළුල් කිරීමටත්, බුද්ධ චරිතය තුළ දැක්වෙන ශ්‍රේෂ්ඨත්වය විදහාපෑමටත්, බුද්ධ භක්තිය සැදැහැවතුන් තුළ කාවැද්දවීමටත් ය. ලංකාවේ සිතුවම් කලාවේ ඉතා පැරණි නිදර්ශනයක් වන තවත් සිත්තම් කඩක් අම්පාරේ පිහිටි "ගොනාගොල්ලෙන්" හමු ව ඇත. ස්ත්‍රී පුරුෂ රූප දෙකකින් මේ සිතුවම සමන්විත වේ. පිරිමි රූපය සමහර විට බෝධිසත්තවයකු පිළිබිඹු කරයි. එහි වම් අතින් මල් පිපෙන රිකිල්ලක් ගෙන ඇත.ගලෙහි වූ ලේඛන අනුව මේ සිත්තම් සීගිරියට පසු පොළොන්නරුවට පෙර යුගයෙහි අඳින ලද්දෙක යනු පරණවිතාන ශූරින්ගේ මතය වුවත්, මෙය තුන්වන සියවස හරියේදී කරන ලද්දක් ලෙස අනුමාන කෙරේ.[8]

---

6 **ඌණ පූර්ණ සහිත මහාවංශයෝ**, සංස්, බුද්දත්ත හිමි. (කොළඹ, ඇම්.ඩී ගුණසේන සහ සමාගම,1959), 30 : 88 - 89 ගාථා

7 මහාවංශය , 32 : 01 - 06 ගාථා

8 ඒ.බී, දිසානායක, **සිංහල සිතුවම් කලාව**, (මහරගම: සමන් මුද්‍රණාලය, 1958).03 පිට.

ශ්‍රී ලංකාවේ මෙතෙක් සොයාගනු ලැබූ සුවිශේෂී සිතුවම් ලෙස පස්වන සියවසට අයත් කාශ්‍යප රාජ්‍ය කාලයේ නිමකළ සිගිරි සිතුවම් හඳුන්වාදිය හැකි ය. සීගිරියේ බටහිර දෙස ගල් බිත්තියෙහි ඇඳි මෙම සිතුවම් විසිඑකක් අදටත් දක්නට ලැබේ. මෙම සෑම සිතුවක්ම නිර්මාණය කර තිබෙන්නේ හුදකලාව සිටින කාන්තාවක නැතිනම් කාන්තාවන් දෙදෙනෙක් වශයෙන් ය. සීගිරි සිතුවම් භාරතීය අජන්තා හා භාග් චිත්‍ර නිර්මාණගත කර තිබෙන ආකාරය, ශෛලීය සළකා බැලීමේදී සමානකමක් දැකිය හැකි ය.[9] කෙසේ වෙතත් සම්භාවනීයභාවයක් දැක්වෙන මෙම සීගිරි සිතුවම් හෙළ කලාකරුවාගේ විශිෂ්ට නිර්මාණ වේ. නූතන යුගය වන විට චිත්‍ර කලාවේ ප්‍රතිභාපූර්ණ ලක්ෂණ කියාපෑමට 18 -20 වන සියවස්වල මෙරට බෞද්ධ වෙහෙර විහාරස්ථානවල ඇඳ ඇති බිතු- සිතුවම් පැහැදිලි වශයෙන්ම කලාග ාරයක් බඳු ය. කැලණි විහාරයේ බිතුසිතුවම් හැඩ කළ සෝලියස් මැන්දිස් කලාකරුවාන්, බොරැල්ලේ ගෝතමී විහාරයේ සිතුවම් චිත්‍රයට නැඟූ ජෝර්ජ්කීට්[10]එම ආභාසය ලබා ගන්නේ මහින්දාගමනයෙන් උදාවූ නව ප්‍රබෝධයේ පසුගාමීන් වශයෙනි.

### මූර්ති, කැටයම් හා ගෘහ නිර්මාණ ශිල්පයේ වර්ධනය

ගෘහ නිර්මාණ ශිල්පය, කැටයම් කලාව හා මූර්ති ශිල්පය ආදි වූ සියලු කලාවන් සංවර්ධනය වී ඇත්තේ මහින්දාගමනයෙන් පසුව අදා වූ නව සංස්කෘතිය තුළින් ය. දාගැබ, බෝධිය, පිළිමය මුල් කොටගත් මෙකී පූජනීය වස්තූන්ගෙන් ඔප් නැංවුණු විශිෂ්ට වූත්, ප්‍රතිභා සම්පන්න වූත් හෙළ කලා කෞශල්‍යයන් ඉතා අපූර්වත්යෙන් යුතු ව මෙරට ජන්මලාභය ලබා ඇත. සඳකඩපහණ, මුරගල, පියග ැටපෙළ, කොරවක්ගල, බිතුසිතුවම් හා බොඳු බැතිය වඩාලූ සෙල්පිළිම තුළින් වහනය වූ බෞද්ධ කලාවේ තෝතැන්න හා ව්‍යාප්තිය මහින්දාගමනයෙන් පසු උදා වූ සංස්කෘතික ප්‍රබෝධයයි. ගෘහ නිර්මාණ ශිල්පය කෙරෙහි ඇති වූ බෞද්ධ බලපෑම් අනුරාධපුර හා පොළොන්නරු යුගවලදී ඉතා මැනවින් පැහැදිලි වේ. මෙකී යුගය තුළ චෛත්‍ය හෙවත් ස්ථූප බොහොමයක් නිර්මාණ වූ අතර මෙරට පැරණිතම දාගැබ බුදුන්ගේ අකුධාතුව නිධන් කොට තැනවූ ථූපාරාමයයි. මුලදී අඩි 400 ක් උස්ව පැවති ජේතවනාරාමය ගඩොලින් තැනූ ලොව උසම දාගැබ ලෙස පිළිගැනේ. මහාථූපය හෙවත් රුවන්වැලිසෑය, මිරිසවැටිය, අභයගිරිය, ලංකාරාමය, පොළොන්නරුවේ රන්කොත් වෙහෙර, තිස්සමහාරාමය, සෝමාවතිය වැනි මහා දාගැබ් හෙළයේ විශිෂ්ට ස්තූප වෙයි.

ස්තූපවලට අමතරව බෞද්ධ ගොඩනැගිලි අතර ඉන්දීය ගෘහ නිර්මාණ ආභාසය උකහා ගෙන ලොවට දයාද කළ ගොඩනැගිලි රැසකි. බෝධිය වටා ඉදිකෙරුණු බෝධිඝර නම් ගොඩනැගිල්ල ද, ප්‍රමාණයෙන් කුඩා ස්තූප ආවරණය සඳහා ඉදිකළ වටදාගෙය හෙවත් චෛතියඝර නම් ගොඩනැගිල්ලද, පටිමාඝර නමින් හැඳින්වෙන පිළිමගෙවල් ද මෙකල ගෘහ නිර්මාණ ශිල්පයේ දියුණුව පැහැදිලි කරයි. මෙයට අමතරව උපෝසථාගාර, සන්නිපාත ශාලා ආදිය ද බෞද්ධ ගෘහ නිර්මාණ ශිල්පයට එක් වූයේ මහින්දාගමනයෙන් ඒකාලෝක වූ නව සංස්කෘතිකමය උදාව නිසාවෙනි.

බුදු දහම නිසා මෙරටට හිමි වූ සංස්කෘතිකාංග අතර කැටයම් කලාව ද විවිධ අංශ ඔස්සේ ව්‍යාප්ත විය. සිංහල කලාකරුවාගේ විශිෂ්ට නිර්මාණ ශක්තිය විදහාලන උසස් නිමැවුමක් ලෙස සඳකඩපහණ හඳුන්වාදිය හැකි ය. නිර්මලතාවෙන් සහ සරලත්වයෙන් පිරිපුන් ය. සඳකඩපහණේ දක්නට ලැබෙන සියුම් කැටයම් ඉතා භාවපූර්ණ සංයතභාවයකින් නෙළා ඇති බව පෙනෙයි. පුද්ගල සංසාරගත උපතත්, ජාති ජරා, මරණ ව්‍යාධි දුක් රැසක් ඔප් නංවන අරුත් බර හෙළයේ මහා කැටයම සඳකඩපහණ බව, සෙනරත් පරණවිතානයන් සිය අදහස දක්වා තිබේ. කැටයම් අතරේ පෙළ ගැස්වෙන මුරගල්, කොරවක්ගල්, පියගැටපෙළ සහ වෙනත් ශෛලමය කැටයම් හෙළ කලාකරුවාගේ අගනා නිමැවුම්ය. අනුරාධපුර රත්නප්‍රාසාදය අබියස වූ මුරගල හෙළ කලා වඩුවාගේ විශිෂ්ටතම කැටයමයි. ස්තූපයක ඊ කවරණ යටතේ අලංකාරයවත්, මෙන්ම දේශීය අනන්‍යතාවය ලොවට විදහාලූ ශෛලමය නිර්මාණය වාහල්කඩයි. ඉතාමත් කලාත්මක, භාවාතිශය වාහල්කඩ මිහින්තලයෙන් හමුවේ. ශෛලමය කැටයම් අතර ඉසුරුමුණි විහාරයේ ප්‍රේම යුවල ද භාවපූර්ණ කැටයමකි.

---

9 එන්. විජේසේකර, **පැරණි සිංහල බිතු සිතුවම්**, පරි. ඇස්.ඩී.ටී. ක්‍රිසැන්නස්, ( කොළඹ: ලංකාන්ඩුවේ මුද්‍රණාලය), 184-185 පිටු.

10 ඒ. ගුණවර්ධන, **සාර්ලිස්ගේ ජන සිතුවම්**, (කෝට්ටේ: ගනනාථපිල්ල සංවර්ධන පර්ෂදය, 1991), 1-2 පිටු.

මෙරට මූර්ති කලාව ද බුදුදහමෙන් පෝෂණය වී ඇත. රළු කලු ගලින් ශ්‍රේෂ්ඨ බුද්ධ ප්‍රතිමා නිර්මාණය කර බුදුන්ගේ මෛත්‍රිය කරුණාව දයාව වැනි ගුණාංග කලු ගලකට සමවද්දන්නට සමත් වී ඇත. සමාධි පිළිමය, අවුකන, තොලුවිල, මාළිගාවිල සහ ගල්විහාරයේ ප්‍රතිමා සියල්ල මෙරට මූර්ති කලාවේ විශිෂ්ට නිමැවුම්ය. ඉරියව් අතින් බලන විට හිඳි, හිටි සහ සැතපෙන පිළිම වශයෙන් ත්‍රිවිදාකාර ඉරියව් මූර්තිමත් කිරීමට මහින්දාගමනයෙන් ඔදවත් නව සංස්කෘතියේ ශිල්ප ශ්‍රේණිවල ගල් වඩුවන් සමත් වී තිබේ. ධර්මචක්‍ර, භූමි ස්පර්ශ, අභය, වැනි අනන්‍ය මුද්‍රා භාවිතයෙන් බුද්ධ ප්‍රතිමා නිමවන්නට හෙළ කලා කරුවා ශක්‍යතාපූර්ණ වූ බව ඩී.ටී. දේවේන්ද්‍ර, සිරි ගුණසිංහ වැන්නන් පෙන්වා දී තිබේ. අසහාය බුදු පිළිමවලට අමතරව දේවතාරූප, රජ, බිසෝ, බෝධිසත්ත්ව ප්‍රතිමා නිර්මාණය සඳහා කලාකරුවා උත්සාහගෙන ඇත. කුෂ්ඨරාජගල බෝධිසත්ත්ව ප්‍රතිමාව, රුවන්වැලිසෑ මළුවේ ඇති ප්‍රතිමාව, පරාක්‍රම සමුද්‍රය අසළ පිහිටුවා ඇති ප්‍රතිමාව ඉන් කිහිපයකි.

## බුදුදහමින් හැඩගැසුණු සමාජ ආර්ථික රටාව

අතීතයේදී ග්‍රාම නිර්මාණ සැලසුම් කළ සිංහලයා ගමේ ප්‍රධාන තැන විහාරස්ථානයට ලබා දුන්නේය. විහාරස්ථානයත්, වැවත්, වෙල් යායත්, ගමත්, එකම දම්වැලක පුරුක් මෙන් එකට ඇඩිවිය. ගොවි සංස්කෘතියත්, බෞද්ධ සංස්කෘතියත් එකට එක්වීමෙන් සිංහල නව සංස්කෘතිය නිර්මාණය වී තිබේ. භික්ෂූන් වහන්සේ මනාකොට සිව්පසයෙන් ශික්ෂණය කරවූයේ ගිහි බෞද්ධයාය. ගම්වැස්සෝ සැදැහැ සිතින් ගමේ විහාරස්ථානය නඩත්තු කළ අතරම දියුණුව හෙළි කළ සෙවනැල්ල බවට බෞද්ධ භික්ෂූන් වහන්සේ පත් විය. ආගම, දහම, අධ්‍යාපනය මෙන්ම චාරිත්‍ර වාරිත්‍ර සම්ප්‍රදායයන් සමාජයට ලබා දුන්නේ භික්ෂූන් වහන්සේ ය. වැසියාගේ සෞඛ්‍ය සම්පන්නභාවය පිළිබඳ සැලකිලිමත් වූ අතර ග්‍රාමීය ආරෝග්‍ය ශාලාව වූයේ විහාරස්ථානයයි. ජනතාවගේ අධිකරණය වූයේ ද ගමේ පන්සලයි. 19 වැනි සියවසේ සිටි වරෙක ප්‍රකාශ කර සිටියේ 'ගමේ පන්සල වැනි උසාවියක් තිබියදී තමන් උසාවියක් කරන එක වැඩක් නැත" කියාය. ඒ අනුව මිහිඳු හිමි ඇතිකළ සඟ පරපුර නව සංස්කෘතියේ කොඳු නාරටිය වූ බව පෙනේ.

මහජන බලය රටට දැනෙන්නට වූයේ භික්ෂූන්ගේ රැකවරණය මතිනි. රාජ්‍යය නිසි පරිදි හැසිරවීමට භික්ෂු උපදේශය අත්‍යවශ්‍ය විය. ගැමුණු තිස්ස මත ගැටුමේදී භික්ෂූන්ගේ මැදිහත්වීම, පළමු වන පරාක්‍රමබාහු, ගජබාහු මත ගැටුමේදී භික්ෂු දායකත්වය ඊට නිදසුන් ය. රජවරුන් රට පාලනය කළ ද ඔවුන්ට මහජ බලය දකින්නට තරම් අවස්ථා මතු කර දුන්නේ බෞද්ධ භික්ෂුවයි. මහින්දාග මනයෙන් පසුව ශ්‍රී ලාංකේය ජනතාවට උරුම වූ තවත් දායදයක් වන්නේ දැහැමි දිවි පෙවෙතයි. බුදු දහම නිසා මෙරට සමාජය භික්ෂු භික්ෂුණී, උපාසක, උපාසිකා වශයෙන් ප්‍රතිව්‍යුහගත විය. බුදු දහමේ ඉගැන්වෙන මෛත්‍රිය, කරුණාව, දයාව, ඉවසීම, උපේක්ෂාව, අල්පේච්ඡතාව වැනි ආධ්‍යාත්මික ගුණ ධර්ම ජනතා සිත් සතන් තුළ රෝපණය විය. කෘෂිකාර්මික ආර්තිකයක නියැලුනු ජනතාව නිදහස් විවේකී කාලය තුළ නැඹුරු වූයේ ආගමික සහ සංස්කෘතික කටයුතු කෙරෙහ ය. එබැවින් රටේ සමගිය පැවති අතර අන්‍යෝන්‍ය වශයෙන් ස්වයංපෝෂිත සමාජ ආර්ථික රටාවක් බිහිවිය. මෙලෙස ස්ථාපිත වූ නව සංස්කෘතිය වැවයි දාගැබයි ගමයි පන්සලයි යන උදාරතම සංකල්පය මුල් කරගත් එකක් වූ බව පෙනේ.

බෞද්ධ ශික්ෂණයෙන් පෝෂණය වූ සිරිත්විරිත්වලට හැඩගැසුණු ජනතාව ශිෂ්ටසම්පන්න පිළිවෙත් අනුගමනය කරන්නට විය. ආහාර අනුභවයේ දී, ඇඳුම් පැළඳුම් පරිහරණයේ දී, ගමන් විලාසයේදී කතාබහේදී ආචාර සම්පන්න හැසිරීමකට අවශ්‍ය ගුණ දහම් බුදු දහමින් උකහා ගැනීමට බෞද්ධයාට හැකිවිය. සිරිත් ඉටු කිරීම, යුතුකම් ඉටු කිරීම බෞද්ධ ජීවන මාර්ගයේ ප්‍රමුඛතම ලක්ෂණයයි. දරුවකු මව් කුස පිළිසිඳ ගැනීමේ සිට අවසානයේ ඉපදී වැඩී මියයන තෙක්ම ඇති දිවි ගමනදී භික්ෂුව ප්‍රධාන විය. දරුවාගේ දාරකෝත්පත්තියට පෙර ගැබිණි මව අරබයා දේශනා කරන අංගුලිමාල පිරිතේ සිට දරුවාට නම් තැබීමටත්, වේලා පත්කඩය සකස්කර ගැනීමටත්, දරුවා පළමු කොට දොරට වඩනා මොහොතටත්, කෙස් කැපීම, ඉඳුල් කට ගෑම, අත්පොත් තැබීම, සරණ බන්ධනය වැනි සෑම අවස්ථාවක් ම භික්ෂු ආශීර්වාදය මධ්‍යයේ සිදුවිය. මෙරට පැවති ආගන්තුක සත්කාර හා ඒවායේ සුන්දරත්වය පිළිබඳ රොබට්නොක්ස් වැනි විදේශීයයන් පවා වර්ණනාත්මකව ගෙන එන්නේ මහින්දාගමනයෙන් හැඩ ගැසුණු සමාජ ආර්ථික තත්ත්වයේ සජීවියත්වය ලොවට හෙළිදරව් කරමිනි.

## සමෝධානය

ශ්‍රී ලාංකේය ඉතිහාසයෙහි ආර්ථික, සමාජයීය, දේශපාලන, සංස්කෘතිකමය වශයෙන් නව ශිෂ්ටාචාරයක යුග පෙරළියක් ඇතිවුයේ මහින්දාගමනය තුළිනි. ස්ථිර ආගමක් ලෙස බුදුදහම ලැබීමේ සිට බ්‍රාහ්මීය අක්ෂර කලාව, කෘෂිකර්මාන්තය, ප්‍රමුඛ කොටගත් ආර්ථිකය, ගෘහ නිර්මාණ, කැටයම් මුර්ති හා සිතුවම් කලාව, රාජභිෂේකය, ස්ථූප වන්දනය, ශ්‍රී මහා බෝධින් වහන්සේගේ දක්ඛිණ ශාඛාව, සාහිත්‍ය හා අධ්‍යාපනය, කුඹල්, මණිකාර බඩු, ලාක්ෂා වැනි කර්මාන්ත ආදී සංස්කෘතික දායාදයන් රැසක් අපට ලැබුනේ මහින්දාගමනය තුළිනි. විශේෂයෙන් සදාචාරාත්මක චාරිත්‍ර වාරිත්‍ර වලින් හෙබි ආධ්‍යාත්මික ගුණ වගාවෙන් පිරිපුන් සංස්කෘතියක් අපට දායාද කළ මහින්දාගමනය තුළින් රෝපිත නව සංස්කෘතික උරුමය අනාගත පරපුරටත් සුරක්ෂිත කොට තැබීම කාලීන අවශ්‍යතාවක් බවට පත්ව තිබේ.